චක්‍රලේඛ අංකය -10/2024

මගේ අංකය -සමු/අයි/CCD/01
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව(බ.ප.)
ආදිපාද වීදිය,
කොළඹ .01
2024.12. 23

බස්නාහිර පළාතේ සියලුම සමුපකාර සමිති වල සභාපතිවරුන් වෙත.

සමුපකාර සමිතිවල කාරක සභා/අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සම්බන්ධවයි.

සමුපකාර සමිති පද්ධතිය වර්තමානයේ විශාල වශයෙන් පුළුල් වී ඇති අතර විශාල මහජන තැන්පතු ප්‍රමාණයක් සමිති තුළ එකරාශි වී ඇත. එලෙස මෙම සමිති විවිධ ව්‍යාපාරික කටයුතු සිදු කරමින් පුළුල් ලෙස ආර්ථික, සමාජීය හා සංස්කෘතික මෙහෙවරක් ඉටු කරනු ලබයි. ඒ අනුව එම සමිතිවල වත්කම්, ප්‍රාග්ධනය,මුල්‍ය ප්‍රතිපිල, සාමාජිකත්වය , තැන්පත් ප්‍රමාණය, ණය ප්‍රමාණය, සාමාජීය මෙහෙවර ආදී සාධක සැළකිල්ලට ගත් විට කුඩා පරිමාණයේ සිට විශාල පරිමාණය දක්වා ව්‍යාප්ත සමිති පද්ධතියක් හඳුනා ගැනීමට ඇත. එබැවින් මෙම සමිති පවත්වාගෙන යාම සඳහා සැලකිය යුතු මට්ටමේ කාර්යය මණ්ඩලයක්ද සේවයේ යෙදී සිටියි.

02.) සමිතිවල කළමනාකරණ තීරණ ගනු ලබන ප්‍රධාන ඒකකය කාරක සභාව/අධ්‍යක්ෂ මණ්ඩලය වන අතර එම තීරණ ක්‍රියාත්මක කිරිමේදි මෙහෙයුම් කාර්යභාරය කාර්යය මණ්ඩලය වෙත පැවරේ. එසේම මෙම සමිතිවල විනය බලධාරියා කාරක සභාව /අධ්‍යක්ෂක මණ්ඩලය වේ. ඒ අනුව මෙම ඒකක දෙක සඳහා වෙන වෙනම භූමිකා පැවරී ඇති බව පැහැදිලි වේ. එකී භූමිකා අතර ගැටුමක් ඇති නොවන ආකාරයට සමිති ක්‍රියාත්මක විය යුතුය.

03.) සමුපකාර සමිතියක මුල්‍ය කළමනාකරණය ඇතුළු කළමනාකරණ බලතල කාරක සභාව/ අධ්‍යක්ෂක මණ්ඩලය සතුවන බැවින් හා එයට අදාළ මෙහෙයුම් කාර්යයන් කාර්ය මණ්ඩලයට පැවරෙන බැවින් එකී කටයුතු වල විනිවිදභාවයත් ,විනයත් ,කාර්යක්ෂමතාවයත්, අරපිරිමැසුම්දායක බවත් ඇති විම සඳහා ඉහත ඒකක වෙන වෙනම ක්‍රියාත්මක විය යුතුය.

04.) නමුත් මෑත කාලීනව කාර්ය මණ්ඩල සාමාජිකයන් කාරක සභික/අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික තනතුරු සඳහා තේරී පත්වීමට උත්සාහ කරන බවත් ඇතැම් සමිතිවල කාර්ය මණ්ඩල සාමාජිකයන් කාරක සභිකයන් වශයෙන් තේරී පත් වී ඇති බවත් මා වෙත වාර්තා වී ඇත. එබදු වතාවරණයක් ඇති වන්නේ නම් ඉහත දැක්වූ පරිදි භූමිකා අතර ගැටුම් නිර්මාණය විය හැකි පරිසරයක් ඇති වේ. එය සමිතියේ ස්ථාවරත්වයටත් අවසාන වශයෙන් අඛණ්ඩ පැවැත්මටත් අහිතකර බලපෑමක් ඇති කරන්නක් විය හැකිය.

05.) යම් සමිතියක කාර්ය මණ්ඩල සාමාජිකයෙකු එම සමිතිය සාමාජිකත්වය දරණ වෙනත් සමිතියක කාරක සභිකයෙකු ලෙස පත්වන්නේ නම් ඉහත දැක්වූ අකාරයට භූමිකා ගැටුමක් නිර්මාණය වීමේ අවකාශයක් ඇත.

06.) එම නිසා සමුපකාර සමිතියක කාර්ය මණ්ඩල සාමාජිකයෙකුට එම සමිතියේ හෝ එකී සමිතිය සාමාජිකත්වය දරන වෙනත් සමුපකාර සමිතියක හෝ කාරක සභිකයෙකු/අධ්‍යක්ෂකවරයෙකු ලෙස කටයුතු කිරිමට අවකාශ නොමැති බවත් යම් කාර්ය මණ්ඩල සාමාජිකයෙකු ඉහත සඳහන් පරිදි සමුපකාර සමිතියක කාරක සභිකයෙකු/අධ්‍යක්ෂණවරයෙකු ලෙස කටයුතු කිරිම මෙම චක්‍ර ලේඛය නිකුත් කරනු ලබන දින සිට නතර වුවායේ සලකා කටයුතු කළ යුතු බව දන්වමි.

07.) එසේම කාර්ය මණ්ඩල සාමාජිකයෙකුගේ සමීප ඥාතියෙකු ඉහත සඳහන් පරිදි කාරක සභිකයෙකු/අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්වීම තුළින්ද ඉහත සඳහන් ගැටළුවම නිර්මාණය වීමේ අවකාශය මතුවන බැවින් පහත විධිවිධාන පරිදි කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ සමීප ඥාතීන් කාරක සභාවට/අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වීමට අවකාශ නොමැති බවත් යම් කාර්ය මණ්ඩල සාමාජිකයෙකුගේ සමීප ඥාතියෙකු සමිතියක කාරක සභිකයෙකු /අධ්‍යක්ෂවරෙයකු ලෙස කටයුතු කිරීම මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන දින සිට නතර වූවාසේ සලකා කටයුතු කළ යුතු බව දන්වමි.

08.) ඇතැම් සමුපකාර සමිතිවල කාරක සභා/ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් තේරී පත් වීමේදී සභාපති හා භාණ්ඩාගාරික ධූර සඳහා සමීප ඥාතීන් පත්වන බවට මා වෙත වාර්තා වී ඇත.ඒ අනුව ගෙවීම් අනුමත කිරීම හා ගෙවීම සිදු කිරීම සමීප ඥාතීන් මගින් සිදුවීම මූල්‍ය පාලනයේ විනිවිදභාවය බිඳ වැටීමට හේතු විය හැක. එම නිසා සමීප ඥාතීන් එකම කාරක සභාවක/ අධ්‍යක්ෂ මණ්ඩලයක සභාපති හා භාණ්ඩාගාරික ධූර සඳහා පත් වීමට අවකාශ නොමැති බවත් එසේම කාරක සභාවක/ අධ්‍යක්ෂ මණ්ඩලයක සභාපති හා භාණ්ඩාගාරික ධූර සඳහා සමීප ඥාතීන් කටයුතු කිරීම චක්‍රලේඛය නිකුත් කරනු ලබන දින සිට නතර වූවාසේ සලකා කටයුතු කළ යුතු බව දන්වමි.

09.) සමීප ඥාතීන් ලෙස කලත්‍රයා, මව, පියා, දූදරුවන්, සහෝදර සහෝදරියන් හා කලත්‍රයාගේ සහෝදර සහෝදරියන්, දූදරුවන්ගේ කලත්‍රයන් අයත් වන බවද වැඩිදුරටත් දන්වමි.

එම්.ඒ.පී. ජයකොඩි
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්
බස්නාහිර පළාත